# G.C.E. ORDINARY LEVEL

## අ.පො.ස. සාමාන්‍ය පෙළ

**STUDENT SEMINAR SERIES - 2017**

ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව - 2017

# HISTORY

## ඉතිහාසය

# QUESTION PAPER - I

## ප්‍රශ්න පත්‍රය - I



Powered by

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**ඉ-ඉගෙනුම් හා නැණසස අධ්‍යාපනික වැඩසටහන් ඒකකය**

**අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය**

**උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2017**

**ඉතිහාසය - I පත්‍රය**

| **11 ශ්‍රේණිය** | **සිංහල මාධ්‍යය** | **කාලය - පැ. 1** |
|---|---|---|

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 80ක් හිමි වේ.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

1. මෙරට ශාසනික ඉතිහාසය පිළිබඳ ලියවී ඇති ග්‍රන්ථයක් වන්නේ,

    (1) රාජාවලිය යි (2) නිකාය සංග්‍රහය යි
    (3) පැරකුම්බා සිරිත යි (4) තිසර සංදේශය යි

2. පූර්ව ඓතිහාසික යුගයේ මහා ශිලා සුසාන පමණක් ඇතුළත් පිළිතුර මින් කුමක් ද?

    (1) ඉබ්බන්කටුව, ගල් සොහොන් කනත්ත, යටිගල් පොත්ත
    (2) ඉබ්බන්කටුව, ගල් සොහොන් කනත්ත, උඩරංචාමඩම
    (3) ඉබ්බන්කටුව, යටිගල් පොත්ත, උඩරංචා මඩම
    (4) ඉබ්බන්කටුව, ගල් සොහොන් කනත්ත, බෙරගල

3. මුල් ඓතිහාසික යුගයේ ධීවරයන් විසූ ගම් හඳුන්වන ලද්දේ කුමන නමින් ද?

    (1) කසීකාරගාම (2) මණිකාරගාම
    (3) කේවට්ටගාම (4) කුම්භකාරගම

4. ගමක ගෘහපතීන් කණ්ඩායමකට නායකත්වය දුන් තැනැත්තා හැඳින්වූ නාමය කුමක් ද?

    (1) දසගම් ඇත්තා (2) පරුමක
    (3) පරුමකලු (4) ගමික

5. ක්‍රි.පූ.250ට අයත් දඹුල්ල කොත්ගල්කන්ද සෙල් ලිපියෙහි "තොට බොජක" යනුවෙන් හඳුන්වා ඇත්තේ ,

    (1) තොටුපළෙහි අය බදු ලබා ගත් පරුමකවරුන් ය.
    (2) රජුගේ පාරම්පරික දේපළ භුක්ති විඳි පිරිස ය.
    (3) පැරණි ගම්වලට ආරක්ෂාව සැපයූවන් ය.
    (4) නගරයේ ප්‍රධාන වාස්තු ශිල්පියා ය.

6. රජරට ශිෂ්ටාචාර සමයේ දී ජනතාවගේ සෞඛ්‍ය පහසුකම් නංවාලීම සඳහා රෝහල් ඉදිකළ රජවරු පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) බුද්ධදාස , IV වන මහින්ද , III කාශ්‍යප (2) බුද්ධදාස , IV කාශ්‍යප , IV මහින්ද

(3) බුද්ධදාස , IV කාශ්‍යප , V වන මහින්ද (4) බුද්ධදාස , V කාශ්‍යප , III සේන

7. IV වන උදය රජු විසින් පිහිටුවන ලද සොරබොර වැව ටැම් ලිපියේ සඳහන් වන්නේ,

(1) අනුරාධපුරයේ කාලසුමන නම් වෙළඳපොළක් පැවති බව ය.

(2) වෙළඳපොළක් පාලනය වූ ආකාරය පිළිබඳව ය.

(3) වරායෙන් ලබා ගත් අය බදු පිළිබඳව ය.

(4) විදේශ වෙළඳාම හා සම්බන්ධ වෙළඳ ශ්‍රේණි පිළිබඳව ය.

8. පුරාණයේ ශ්‍රී ලංකාවේ පිහිටි කර්මාන්ත A තීරුවේ ද ඒ හා සම්බන්ධ වර්තමාන නාමය B තීරුවේ ද දක්වා ඇත. ඒවා නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

| A | B |
|---|---|
| 1. තතවය | A රන්කරු |
| 2. දටික | B ව්‍යාපාරික |
| 3. වාපර | C නූල් කටින්නා |
| 4. තුලාදර | D ඇත්දත් කැටයම් ශිල්පියා |
| | E තඹකරුවා |

(1) ABCD (2) CDAB (3) EBAD (4) CDBA

9. වසභ රජුගේ නිර්මාණයක් වන ඇළහැර ඇළෙන් පෝෂණය වන වැව් පමණක් ඇතුළත් වන පිළිතුර වන්නේ මින් කුමක් ද?

(1) මින්නේරිය වැව, ගිරිතලේ වැව, කන්තලේ වැව, කවුඩුල්ල වැව

(2) කන්තලේ වැව, ගිරිතලේ වැව, කවුඩුල්ල වැව, තිසා වැව

(3) කවුඩුල්ල වැව, මින්නේරිය වැව, පරාක්‍රම සමුද්‍රය, තෝපා වැව

(4) කන්තලේ වැව, ගිරිතලේ වැව, පදවිය වැව, දුඹුටුළු වැව

10. ක්‍රි ව 1982 දී පුරා විද්‍යා කැණීම්වලින් ශල්‍ය වෛද්‍ය උපකරණ හමු වූ ස්ථානය වන්නේ,

(1) මිහින්තලේ රෝහල ය. (2) පොළොන්නරුවේ ආලහන පිරිවෙන ය.

(3) සීගිරි රෝහල ය. (4) මාලිගාවිල රෝහල ය.

11. ක්‍රි.පූ.3 වන සියවස පමණ වන විට ස්වාභාවික සුළං බලයෙන් යකඩ නිස්සාරණය කිරීමේ තාක්ෂණය පැවති බවට සාධක හමු වූ ස්ථානය වන්නේ,

(1) බලංගොඩ සමනල වැව ප්‍රදේශය යි. (2) සීගිරිය අලකොළ වැව ප්‍රදේශය යි.

(3) ඌව පළාතේ බෙරගල ප්‍රදේශය යි. (4) අනුරාධපුර මිහින්තලේ ප්‍රදේශය යි.

12. පහත සඳහන් බදු වර්ග අතරින් ජලය හා සම්බන්ධ බදු වර්ග දෙකක් පමණක් ඇතුළත් පිළිතුර වන්නේ මින් කුමක් ද?

A දකපති B කැති අඩ C මතරමපිබක D බොජකපති

(1) A හා B (2) A හා C (3) C හා D (4) A හා D

13. "වල්වල දඬුපත් නොකපනු ඉසා" යනුවෙන් පරිසර සංරක්ෂණය පිළිබඳ සෙල් ලිපියක සඳහන් කළ රජතුමා වන්නේ,

(1) IV මිහිඳු රජ ය. (2) III කාශ්‍යප රජු ය. (3) V කාශ්‍යප ය. (4) III උදය රජු ය.

14. I විජයබාහු රජුට කුඩා කාලයේ රැකවරණය සපයන ලද ප්‍රාදේශීය පාලකයා වන්නේ,

(1) තනසීව ගෘහපතියා ය. (2) සිත්නාරුබිම බුදල්නා ය.
(3) පණ්ඩුල බ්‍රාහ්මණයා ය. (4) තීය බ්‍රාහ්මණයා ය.

15. අතීතයේ දී " වජ්‍ර චුම්බට " නමින් හඳුන්වනු ලැබූ උපකරණය යොදා ගන්නා ලද්දේ පහත සඳහන් කුමන කාර්යය සඳහා ද?

(1) සීගිරි ජල උද්‍යානයේ ජල මල් ක්‍රියා කරවීම සඳහා ය.
(2) නගරාශ්‍රිත අප ජලය බැහැර කරවීම සඳහා ය.
(3) යපස්වලින් යකඩ වෙන් කරවා ගැනීම සඳහා ය.
(4) අකුණුවලින් උස් ගොඩනැගිලි ආරක්ෂා කිරීම සඳහා ය.

16. අනුරාධපුරය හැඳින්වීම සඳහා " නුරුපුර " යන නම භාවිත කරන ලද්දේ,

(1) වල්ලිපුරම් රන් සන්නසේ ය. (2) සමන්ත පාසාදිකාවේ ය.
(3) පනාකඩුව තඹ සන්නසේ ය. (4) ජාතකට්ඨ කථාවේ ය.

17. මල් කැටයම් 21කින් යුත් වී ඇටයක ප්‍රමාණයේ රන් තැල්ලක කොටසක් හමු වී ඇති ස්ථානය වනුයේ,

(1) උඩරංචාමඩම කැණීම්වලිනි. (2) සීගිරි කැණීම්වලිනි.
(3) අභයගිරි කැණීම්වලිනි. (4) ජේතවන කැණීම්වලිනි.

18. යාබද සිතියමේ දෙවන නාගරික ශිෂ්ටාචාරයට අයත් ස්ථාන A,B,C,D අනුපිළිවෙළින් ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

(1) දඹදෙණිය , යාපහුව , ගම්පොළ , කෝට්ටේ
(2) යාපහුව , දඹදෙණිය , කෝට්ටේ , ගම්පොළ
(3) ගම්පොළ , යාපහුව , දඹදෙණිය , කෝට්ටේ
(4) ගම්පොළ , කෝට්ටේ , යාපහුව , දඹදෙණිය

19. පහත 'අ' සහ 'ආ' තීරු ගැළපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

| | |
|---|---|
| (1) මඩිගෙ බද්ද | A වළං තැනීම |
| (2) කුරුවේ බද්ද | B රෙදි විවීම |
| (3) බඩහැල බද්ද | C ප්‍රවාහන කටයුතු |
| (4) හැඳ බද්ද | D මාළු ඇල්ලීම |
| | E ඇතුන් ඇල්ලීම |

(1) ABCD (2) CEAD (3) DCAB (4) CEAB

20. යුරෝපා රටවල් අතරින් දේශ ගවේෂණය සඳහා පළමුව යොමු වූ රටවල් ද්විත්වය කුමක් ද?

(1) පෘතුගාලය ------------. බ්‍රිතාන්‍යය (2) පෘතුගාලය . - ස්පාඤ්ඤය
(3) ස්පාඤ්ඤය . - ප්‍රංශය (4) බ්‍රිතාන්‍යය -. ඕලන්දය

21. ක්‍රි.ව. 1521 විජයබා කොල්ලයෙන් පසු කෝට්ටේ , සීතාවක හා රයිගම රාජධානිවල පාලකයන් පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) මායාදුන්නේ, මද්දුම බණ්ඩාර , බුවනෙකබාහු ය.
(2) මද්දුම බණ්ඩාර , බුවනෙකබාහු , මායාදුන්නේ ය.
(3) බුවනෙකබාහු , මද්දුම බණ්ඩාර , මායාදුන්නේ ය.
(4) බුවනෙකබාහු , මායාදුන්නේ , මද්දුම බණ්ඩාර ය.

22. VI පරාක්‍රමබාහු රාජ්‍ය කාලයේ ලංකාවට පැමිණි විදේශිකයෙකුට අසන්නට **නොලැබෙන** සිදුවීමක් වන්නේ,

(1) කැකුලන්දල පතිරාජ ඇතුළු පිරිසක් සිංහල සංගෙ නමින් කැරැල්ලක් ඇති කිරීම ය.
(2) ක්‍රි.ව. 1247 දී චන්ද්‍රභානු ලංකාව ආක්‍රමණය කිරීම ය.
(3) නිශ්ශංක අලගක්කෝණාර විසින් කෝට්ටේ බලකොටුවක් ඉදි කිරීම ය.
(4) චෙංහෝ සෙනෙවි මෙරට ආක්‍රමණය කර වීර අලකේෂ්වර ඇතුළු පිරිසක් රැගෙන යාම ය.

23. කුරුණෑගල සමයේ රචනා වූ සාහිත්‍ය ග්‍රන්ථ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) දළදා සිරිත , කව්සිළුමිණ , පූජාවලිය
(2) සිදත් සඟරාව , දළදා සිරිත , සිංහල බෝධි වංශය
(3) දළදා පූජාවලිය , දළදා සිරිත , සිංහල බෝධි වංශය
(4) පූජාවලිය , රසවාහිනිය , පන්සිය පනස් ජාතක පොත

24. මහනුවර යුගයේ රජු විසින් පමණක් විසඳනු ලැබූ නඩු පමණක් ඇතුළත් පිළිතුර මින් කුමක් ද?

(1) ඉඩම් ආරවුල් සම්බන්ධ නඩු (2) කැරළි කෝලාහල සම්බන්ධ නඩු
(3) වැව්වල ජලය බෙදා ගැනීම සම්බන්ධ නඩු (4) රාජකාරි බෙදා දීම සම්බන්ධ නඩු

25. පෘතුගීසීන් උඩරට රාජධානියට එල්ල කළ සියලු ම ආක්‍රමණ අසාර්ථක වීමට බලපෑ ප්‍රධාන ම හේතුව වන්නේ,

(1) පෘතුගීසීන් සතුව නවීන අවි ආයුධ නොතිබීම ය.
(2) පෘතුගීසි හේවායින්ගේ ප්‍රමාණය අඩු වීම ය.
(3) උඩරට ජනතාවගේ රාජපාක්ෂිකභාවය යි.
(4) පෘතුගීසි හේවායින් අතර එකමුතුවක් නොතිබීම යි.

26. පහත සඳහන් සටන් අතරින් පළමුවන විමලධර්මසූරිය රජුගේ නායකත්වය යටතේ මෙහෙයවන ලද සටන් ද්විත්වය වන්නේ,

(1) රන්දෙනිවල හා දන්තුරේ සටන් ය. (2) ගන්නෝරුව හා දන්තුරේ සටන් ය.
(3) රන්දෙනිවල හා බලන සටන් ය. (4) බලන හා දන්තුරේ සටන් ය.

27. ඉතාලියේ ප්ලෝරන්ස්හි සිස්ටයින් දේවස්ථානයේ සිවිලිමේ සිතුවම් නිර්මාණය කළ චිත්‍ර ශිල්පියා වන්නේ කවුරුන් ද?

(1) මයිකල් ආන්ජලෝ (2) ලියනාඩෝ ඩාවින්චි
(3) රෆායල් සැන්ඩි (4) බොකෑෂියෝ

28. ලන්දේසි ජාතිකයින්ගේ පෙරදිග පාලන මූලස්ථානය පිහිටි ස්ථානය වන්නේ,

(1) ඉන්දියාවේ ගෝව ය. (2) ඉන්දියාවේ චන්දි නගර් ය.
(3) ජාවා දූපතේ බතාවි ය. (4) ඉන්දියාවේ කල්කටා ය.

29. මෙරට වතු කම්කරුවන්ගේ වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටි වෘත්තීය සංගම් නායකයෙකු වන්නේ,

(1) ඒ.ඊ.ගුණසිංහ මහතා ය. (2) එන්.එම්.පෙරේරා මහතා ය.
(3) පොන්නම්බලම් අරුණාචලම් මහතා ය. (4) නටේස අයියර් මහතා ය.

30. මූලික මිනිස් අයිතිවාසිකම් හා නන් වැදෑරුම් නිදහස පිළිබඳව වගන්තියක් ප්‍රථම වතාවට ඇතුළත් කරන ලද්දේ පහත සඳහන් කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ද?

(1) 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ය.
(2) 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ය.
(3) 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ය.
(4) 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ය.

31. ශ්‍රී ලංකාව කෙරෙහි බ්‍රිතාන්‍යන්ගේ අවධානය යොමු වීම කෙරෙහි බලපෑ ප්‍රධාන ම හේතුව වූයේ,

(1) බ්‍රිතාන්‍ය හා ප්‍රංශය අතර ඇති වී තිබූ වෙළෙඳ තරගය නිසා ය.
(2) කාර්මික භාණ්ඩ අලෙවි කළ හැකි වෙළෙඳ පොළක් ලෙස වැදගත් වූ නිසා ය.
(3) ශ්‍රී ලංකාවේ භෞතික පිහිටීමේ වැදගත්කම නිසා ය.
(4) ලංකාවේ සිට ඉන්දියාවේ පාලන කටයුතු මෙහෙයවිය හැකි වූ නිසා ය.

■ පහත A සිට E දක්වා ඇති තොරතුරු ඇසුරු කර ගෙන 32 සහ 33 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - රජයේ ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තිය
B - කැප්පෙටිපොළ දිසාවේ
C - රොබට් බ්‍රවුන්රිග්
D - ටොරින්ටන් ආණ්ඩුකාරවරයාගේ නව බදු ප්‍රතිපත්තිය
E - ජෝතිය සිටුවරයාගේ කැරැල්ල

32. ක්‍රි.ව.1818 නිදහස් සටන හා සම්බන්ධ තොරතුරු පමණක් ඇතුළත් පිළිතුරු යුගලය කුමක් ද?

(1) A හා C (2) B හා C (3) B හා E (4) B හා D

33. ක්‍රි.ව.1848 නිදහස් සටන හා සම්බන්ධ තොරතුරු පමණක් ඇතුළත් පිළිතුරු යුගලය කුමක් ද?

(1) A හා D (2) B හා D (3) A හා C (4) D හා E

34. ශ්‍රී ලංකාවේ වඩාත් පැරණි ම දේශපාලන පක්ෂය ලෙස සලකනු ලබන්නේ,

(1) එක්සත් ජාතික පක්ෂය යි. (2) සම සමාජ පක්ෂය යි.
(3) ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යි. (4) බොල්ෂෙවික් ලෙනින් පක්ෂය යි.

35. විසිවන සියවසේ මුල් භාගයේ දී ලාංකීය නිදහස් සටන් ව්‍යාපාරය සඳහා අවශ්‍ය පන්නරය ලබා දීමට මෙරටට පැමිණි ඉන්දීය නායකයා වන්නේ,

(1) සුරේන්ද්‍රනාත් බැනර්ජි මහතා ය. (2) මහත්මා ගාන්ධි තුමා ය.
(3) බාල් ගංගාධර් තිලක් මහතා ය. (4) ලාලා ලජ්පත් රායි මහතා ය.

■ පහත සඳහන් A,B,C හා D හි දැක්වෙන ප්‍රකාශ /පද යුගල අධ්‍යයනය කර 36,37,38 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - 1. XVI ලුවී රජුගේ අත්තනෝමතික ක්‍රියා කලාපය.
2. ප්‍රංශ විප්ලවය

B - 1. බොස්ටන් තේ සාදය
2. ටෙනිස් පිටියේ දිවුරුම

C - 1. රුසියන් විප්ලවය
2. සමාජවාදී පාලන ක්‍රමය

D - 1. ෆ්‍රාන්ස් පර්ඩිනන්ඩ් කුමරුගේ ඝාතනය
2. පළමුවන ලෝක යුද්ධය

36. දෙවැන්නේ ආරම්භයට පළමු වැන්නේ වර්ධනය බලපෑ බව පෙන්වන ප්‍රකාශය කුමක් ද?

(1) B (2) C (3) A (4) D

37. පළමුවැන්නේ වර්ධනය සමග දෙවැන්න ආරම්භ වීම පෙන්වන ප්‍රකාශ / පද යුගලය කුමක් ද?

(1) D (2) B (3) C (4) A

38. පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධයක් නොපෙන්වන ප්‍රකාශ / පද යුගලය කුමක් ද?

(1) D (2) B (3) C (4) A

39. සූරිය මල් ව්‍යාපාරය ආරම්භ කිරීමේ ප්‍රධාන පරමාර්ථය වූයේ,

(1) සම සමාජ පක්ෂය නිදහස සඳහා ගෙන ගිය ප්‍රචාරක කටයුතු ව්‍යාප්ත කිරීම සඳහා ය.
(2) දෙවන ලෝක යුද්ධයෙන් මිය ගිය සොල්දාදුවන්ගේ පවුල්වලට ආධාර දීම සඳහා ය.
(3) රාජ්‍ය මන්ත්‍රණ සභාවේ නිදහස සඳහා ගෙන ගිය උද්ඝෝෂණ ව්‍යාපාර සඳහා ය.
(4) ලංකා ජාතික සංගමය නිදහස සඳහා ගෙන ගිය උද්ඝෝෂණ ව්‍යාපාර සඳහා ය.

40. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිශේධ බලය හිමි නිත්‍ය සාමාජික රටවල් පහ නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) ඇමරිකා එක්සත් ජනපදය , සෝවියට් සංගමය , එක්සත් රාජධානිය , ප්‍රංශය , චීනය
(2) ඇමරිකා එක්සත් ජනපදය , එක්සත් රාජධානිය , ජපානය , ප්‍රංශය , ජර්මනිය
(3) සෝවියට් සංගමය , ජර්මනිය , චීනය , ප්‍රංශය , එක්සත් රාජධානිය
(4) ඇමරිකා එක්සත් ජනපදය , ජර්මනිය , ජපානය , චීනය , සෝවියට් සංගමය


ඉන්ටනෙට් සෙල්ලං
දිනක වේදෝ ලෙල්ලන්
නැණවත් අන්තර්ජාල භාවිතය ඔබේ වගකීමකි. ඒ සඳහා හැමවිට වැඩිහිටි මග පෙන්වීම ලබාගන්න
Dialog
තිරසාරත්ව අංශයේ පණිවිඩයකි